**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මෑතකදී නිකුත් කරන ලද රෙගුලාසි පිළිබඳව වූ දැඩි ලෙස සැලකිලිමත් වියයුතු අහිතකර තත්ත්වයන්.**

වර්ෂ 2021 මාර්තු 12 වන දින ප්‍රකාශයට පත් කරන ලද වර්ෂ 2021 අංක 01 දරණ රෙගුලාසිය (මෙතැන් සිට රෙගුලාසි යනුවෙන් හඳුන්වනු ලබන), ත්‍රස්තවාදය වැලැක්වීමේ (දැඩි අන්තවාදී ආගමික මතවාද දැරීමෙන් මුදවා ගැනීමේ) නියෝග සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය [Center for Policy Alternatives (CPA)] තැති ගැනීමට පත්ව සිටී. මෙකී රෙගුලාසි කෙටුම්පත් කර ඇති ස්වභාවය අනුව, විශේෂයෙන් ආගමික හා ජනවාර්ගික සුළුතර ජන කණ්ඩායම් ඇතුළුව පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සහ නිදහස තවදුරටත් අවදානමට ලක් වීමක් සිදුවිය හැකි අතර, රජය විසින් පුද්ගල අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ නෛතික අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිසි ක්‍රියාදාමයන් පිළිබඳ කිසිදු සහතික කිරීමක් නොමැති මෙම පසුබිම තුළ දේශපාලන විසම්මුතිය සඳහා පවතින ඉඩ ප්‍රස්ථාව තවදුරටත් අවම කිරීමක් සිදු වේ. මීට අමතරව, මෙම රෙගුලාසි මඟින් බලතල වෙන් කිරීම ඉතා පැහැදිලි වශයෙන්ම උල්ලංඝනය කිරීමක් වන අතර, ජනතාවගේ අධිකරණ බලයෙන් කොටසක් ආණ්ඩුවෙහි විධායක අංශය වෙත පැවරීමේ තත්වයක් පිළිබිඹු වේ. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වූ දරුණු අන්දමේ නීතියක් වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත [Prevention of Terrorism Act (PTA)] උපයෝගී කර ගැනීමට සහ එය තවදුරත් ශක්තිමත්ව ආරක්ෂා කිරීමේ නවතම උත්සාහයක් වශයෙන් මෙම නව රෙගුලාසි පැනවීම සිදුකර ඇති බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සඳහන් කරනු ලබයි. එබැවින්, මෙම රෙගුලාසි මඟින් සිවිල් නිදහස කෙරෙහි මෙන්ම ශ්‍රී ලංකාවෙහි නීතියේ ආධිපත්‍යය කෙරෙහි ද දැඩි අගතිගාමී බලපෑම් උද්ගත කළ හැකි වීම හේතුවෙන් මෙකී රෙගුලාසි අහෝසි කළ යුතුය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විශේෂයෙන් සැලකිලිමත් වන්නේ, 'පුනරුත්ථාපන' කිරීම සම්බන්ධයෙන් පවතින විධිවිධානය සහ රජය විසින් පුද්ගල අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ නෛතික අවශ්‍යතාවය සම්බන්ධයෙන් වන ප්‍රමිතීන්ට ඇති බලපෑම පිළිබඳව ය. මෙකී රෙගුලාසි මඟින් නිශ්චිත පුද්ගල කණ්ඩායම් පුනරුත්ථාපනය කිරීම සඳහා පහසුකම් සපයන බව ප්‍රකාශ කෙරෙන නමුදු, එකී විධිවිධාන ක්‍රියාත්මක කිරීම ඔස්සේ,  නිසි අධිකරණයක් ඉදිරියේ කිසිදු නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කිරීමකින් තොරව පුද්ගලයන්ගේ නිදහස වසර දෙකක් දක්වා වූ කාලයකට (එනම් මූලික නියෝගය මඟින් වසරක කාලයකට සහ ඉන් පසුව එකී කාලය තවත් වසරක කාලයක් දක්වා දීර්ඝ කළ හැකිය) අහිමි කිරීමේ හැකියාව ඇත. එවැනි විධිවිධානයක් මඟින් රජය විසින් පුද්ගල අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ නෛතික අවශ්‍යතාවය සම්බන්ධයෙන් සහතික කිරීමක් නොමැතිවම පුද්ගලයන්ගේ නිදහස අහිමි කරනු ඇත.

ජනවාර්ගික හා ආගමික වශයෙන් වන සුළුතර ජන කණ්ඩායම් ඉලක්ක කර ගැනීම පිණිස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සියල්ලන්ටම සමාන නොවන අන්දමට භාවිත කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ශ්‍රී ලංකාවේ අතීත අත්දැකීම් ඔස්සේ පිළිබිඹු වන අතර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් වසර ගණනාවක් පුරාවටම එකී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කරන ලෙසට ඉල්ලා ඇති අතර එකී ඉල්ලීම මෙමඟින් ද නැවත වරක් අවධාරණය කරනු ලැබේ. අධිකරණ මඟින් සිදුවන අධීක්ෂණය සහ රජය විසින් පුද්ගල අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ නෛතික අවශ්‍යතාවය සම්බන්ධයෙන් වන ප්‍රමිතීන් ඉවත් කිරීමත් සමඟම මෙකී රෙගුලාසි ඔස්සේ දැනට පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් ලබාදෙනු ලබන සීමිත ආරක්ෂාවන් පවා ඉවත්ව, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් පිළිගත් මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් අතිශයින්ම බරපතල අවදානමක් උද්ගත වන තත්වයක් නිර්මාණය කරනු ඇත.

තවද, මෙම රෙගුලාසි වල නොපැහැදිලි බව සහ නිශ්චිත අරමුණක් කෙරෙහි කේන්ද්‍රගතව නොමැති වීමේ ස්වභාවය භයානක වන අතර එය අපයෝජන තත්වයන්ට තුඩු දිය හැකිය. නිදසුනක් වශයෙන්, 'පුනරුත්ථාපනය' යනු කුමක්ද යන්න පිළිබඳව හෝ මෙකී රෙගුලාසිය ප්‍රකාරව ස්ථාපිත කළ යුතුව පවතින 'ඒකාබද්ධතා මධ්‍යස්ථාන' වලදී අනුගමනය කළ යුතු පුනරුත්ථාපන ක්‍රියා පටිපාටින් පිළිබඳව ඉතාම අවම හෝ කිසිදු තොරතුරක් ලබා දී නොමැති තත්වයක් පෙන්නුම් කරනු ලබයි. තවද, මෙකී මධ්‍යස්ථානයන්හි ක්‍රියාකාරීත්වය, එනම් පත්වාගත යුතු තත්වයන් සහ නිරීක්ෂණ යාන්ත්‍රණය ආදී  කටයුතු, පැවතිය යුත්තේ කවර නම් වූ නීති හා රෙගුලාසි යටතේ ද යන්න පිළිබඳ තොරතුරු ද ප්‍රමාණවත් තරම් නොමැත. හමුදාකරණය වීම ඉහළ මට්ටමක පවතින පාලන තත්වයක් ඇති පසුබිමක සහ ස්වාධීන ආයතන දුර්වල කිරීමේ තත්වයක් යටතේ මෙවැනි ගැටළුකාරී ස්වභාවයන් මඟින් පවතින තත්වය තවදුරටත් උග්‍ර වීමට හේතු වේ.

අවසාන වශයෙන්, පුනරුත්ථාපන ක්‍රියාවලීන් සමස්තයක් ලෙස අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියට අන්තර්ග්‍රහණය කිරීමේ අවශ්‍යතාවය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් හඳුනාගනු ලබන මුත්, මෙය රජය විසින් පුද්ගල අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ නෛතික අවශ්‍යතාවය සම්බන්ධයෙන් සහතික කිරීමේ ප්‍රමිතීන්ට අනුකූලව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව සහතික කර ඇති අයිතිවාසිකම් සහ නිදහස ආදියට අනුකූල වන පරිදි නීත්‍යානුකූලව සිදු කළ යුතුය. වාර්ගික අසමගිය ඇති කිරීමට පොළඹවන ලද බවට චෝදනා කරනු ලබන ප්‍රකාශයන් පදනම් කර ගනිමින් සිදුවන අත් අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් වැඩි වශයෙන් සිදුවන පසුබිමක, ඉහත පෙන්වාදුන් අන්දමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.